14 වන පිටුවෙන් (අඛණ්ඩ)

වෙයි. ".. මං කිව්වා තුවාල කාරයො දෙන්නව කොළඹ ගෙනියන්න කියලා.." ඔහු කියන්නේ රණසිංහට වුවද සැමට ම ඇසෙන්නට ය. "..ඊයෙ හොරණ දි හාමුදුරුවන්ගෙ පක්සෙ අයට අපේ උන් ගහලා.. මේව හරි අසික්කිත වැඩ රණසිංහ මහත්තයා.. මං නං කොහෙත්ම අනුමත කරන්නෙ නෑ ඕවා.. හාමුදුරුවන් එක්ක දේශපාලනය කළත් වෙන කා එක්ක දේශපාලනය කළත් ඒක කරන්ඩ ඕනෙ ප්‍රතිපත්ති මත.. අතේ පයේ හයියෙන් නෙවෙයි.. මේක ජේ ආර් ගෙ කාලෙ නෙවෙයි කියන එක අපි මිනිස්සුන්ට ක්‍රියාවෙන්ම පෙන්නලා දෙන්න ඕනෙ.."

තෙම්පරාදු දේශපාලකයන් වන පියසෝම වැනි හීන් නූල් කාරයන් ගැන රණසිංහ හොඳින් දනියි. ඒ නිසාම පියසෝම දොඩන දේ ගැන වැඩි දුර සිතන්නට ඔහු නොවෙහෙසෙයි.

".. මං කියන්නෙ රණසිංහ මහත්තයා දොස්තරලට වැටුප් විෂමතා ප්‍රශ්නයක් තිබුණා නං ඒක මේ මැතිවරණයක් අස්සෙ ඇදල ගන්න ඕනෙ කමක් නැහැනෙ.. මේක තනිකරම කුමන්ත්‍රණයක්.. තනිකරම ප්‍රතිගාමී කුමන්ත්‍රණයක්"

රණසිංහ සිටියේ දැවැන්ත මානසික පීඩාවක ය. මේ ගමන එන්නට ඔහු සිතේ කොහෙත්ම කැමැත්තක් නොවී ය. පිට පිට මුහුණ දෙන්නට සිදුවූ අනපේක්ෂිත සිදුවීම් මාලාවෙන් ඔහු හෙම්බත්ව සිටියි. පියසෝම ගේ මැතිවරණ ව්‍යාපාරයට සහය දෙන්නට ආවේ පළමුව ලොක්කාගෙන් බේරෙන්නට ය. දෙවනුව තමාටද හුදකලාවේ සටන් කිරීමට නොහැකි බව දන්නා නිසා ය.

වින්ධ්‍යා තමා අතැර යාමටත් වඩා ඔහු සිත සසළ කළේ අයේෂා සම්බන්ධ සිදුවීමයි. අයේෂා ගේ දෙමාපියන් හමුවේ සැහැල්ලුවෙන් පෙනී සිටින්නට උත්සාහ කළ ද සැබැවින්ම ඔහු සිටියේ දැඩි අභ්‍යන්තර කැළඹීමක ය. මේ සියල්ල සිත දරා ගනිමින් සමාජය හමුවේ සිනා මුවින් සිටින්නට සිදුවීම කෙතරම් පීඩාකාරී දැයි දැන සිටියේ ඔහු ම පමණකි.

තවත් වේලාවක් රැඳෙන්නැයි පියසෝම කළ දැඩි ආයාචනය පවා නොතකා රණසිංහ ආපසු එන්නට වාහනයට ගොඩ වන්නේ හැකි ඉක්මණින් තනි වන්නට අවශ්‍යව සිටි නිසා ය.

මෙවන් කාලයක සුනන්ද ළඟ නොසිටීමේ අවාසිය ඔහුට දැන් වඩාත් දැනෙයි. එහෙයියෙක් නොවී තමාට කෙළින් උපදෙසක් දෙන්නට තරම් ශක්තියක් තිබූ එකම පුද්ගලයා අවශ්‍යම වේලාවේදී තමා හැර ගොස් තිබීම අභාග්‍යයකි. අතීතයේදී තමා කරදරයට පත් වූ සෑම තැනකදීම තමා ආවරණය කරගත් ආරක්ෂා කරගත් හිතවතා ගේ නික්ම යාම රණසිංහ ගේ සිතේ දැන් දැන් දැඩි වේදනාවක් ඇති කරයි. ඒ අඩුව පුරවන්නට අජිත්ට නොහැකි ය. සුනන්ද නම් වන නිහඬ මිනිසා තුළ තිබූ ගැඹුර අජිත් තුළ නැත.

"ගෙදර යනකල් මාව ඇහැරවන්න එපා.." සිය සැප වාහනයේ පසුපස අසුනේ වාඩිවන රණසිංහ දෑස් පියාගනියි.

00000000000

අම්මා බෙදා දුන් බත් පිඟාන අජිත් අතට ගන්නේ මහත් සතුටකිනි. අම්මා අතින් පිසූ උණු බතක රස බලන්නට ඉඩක් ලැබුණේ සති කීයකට පසුව දැයි ඔහුට නිනච්චක් නැත. රණසිංහ ගේ මැතිවරණ ව්‍යාපාරය හේතුවෙන් ජීවිතය අති විශාල කළබැගෑනියකට මැදිව ඇත. මේ අත්දැකීම් සියල්ල කොයි තරම් දුෂ්කර වුව ද විශාල ආත්ම තෘප්තියක් ගෙන දෙයි. සමාජයෙන් මේ සා ගරු බුහුමන් ලැබග න්නට ඉඩක් ලැබීම භාග්‍යයකි. ඒ තෘප්තිය ඇති තරම් විඳගත යුතු යයි අජිත් ගේ සිත කියයි.

"තන්තිරිමලේ කෑම්ප් එකක බෝම්බයක් පිපිරිලා හමුදාවෙ දෙන්නෙක් මැරිලලු නේද..?" අම්මා අසන්නේ අජිත් ගේ බත් පිඟානට තවත් මාලු කැබැල්ලක් දමමිනි.

"හ්ම්.." අජිත් අම්මාගේ මුහුණ බලන්නේ ප්‍රශ්නාර්ථයක් රඳවාගත් දෑසිනි.

"එක අතකින් හොඳ වෙලාවට පුතා හමුදාවෙන් ආවෙ.. මම ඒ කාලෙ හිටියෙ පපුවෙ ගින්දරෙන් පිච්චි පිච්චි"

**"උඹ මෙතන දන්නෙ නෑ නේද..? මේ තමයි ඉස්සර මගේ මාළිගාව.. අපායත් මෙතනම තමයි තිබුණෙ.. හොඳින් හරි නරකින් හරි යමක් කරන්න ඕනෙ වුනාම ඒ කාලෙ අපි එකතු වුණේ මෙතනට.. උඹ දන්නව මං මේ හැම දෙයකින්ම අත් මිදිලා අලුතින්ම ජීවිතේ පටන් ගන්න හදන බව.. ඒ නිසා ආයෙම වතාවක් මාව මේ ලෝකෙට ඇදල දාන්ඩ එපා මල්ලි.. දෙයියන්ගෙ නාමෙන් මං අහන දේට කෙළින් උත්තර දීපං.."**

"ඒ බෝමබෙ කොටි වැඩක් නෙවෙයි.. ඇතුළෙදි වෙච්ච අත්වැරදීමක්.. ට්‍රේනිං එකකදි.. ඒ වගේ දේවල් කෑම්ප් එකක වෙන්න පුලුවන්"

"කාගෙ වැඩක් වුණත් ඒ රස්සාව ඕනෙ නැහැ.. උඹේ හිතුවක්කාරකමට ගියා මිසක් කවදාවත් මගේ හිතේ කිසිම කැමැත්තක් තිබුණෙ නැහැ උඹ තුවක්කුවක් උරැක් කරගෙ න ඉන්නවා දකින්න.. මං හතර පෝයට සිල් ගන්න ගෑනියෙක්.."

වත්තට හැරවූ වාහනයක ලාම්පු එළිය ජනේලයෙන් සාලයට වැටෙයි. එය මිදුලේ නතරවන ශබ්දයත් දොර ඇරෙන ශබ්දයත් ඇසෙයි.

"රණසිංහ මහත්තය ගෙන් පණිවිඩයක් වගේ.." අජිත් පිඟාන පසකෙ තබා අත සෝදා ගනියි. පැමිණි අමුත්තා දොරට සන් කරන්නටත් පෙර අජිත් දොර අරියි.

මිදුලේ අඩ අඳුරේ කිසිවකු සිට ගෙන සිටියි. අඳුරේ වුව ඒ තැනැත්තා හඳුනාගන්නට ඒ තරම් අපහසුවක් නැත.

"සුනන්දයියා..."

"ඔව්... මං ආවෙ උඹ හම්බවෙන්න.."

"මාව..? හදිසියක් ද..? එන්න ඇතුළට.." අජිත් දොර වෙතින් මෑත් වන්නේ සුනන්දට ගෙතුළට ඒමට ඉඩ සදනු පිණිස ය.

"නැහැ.. ඕනෙ නැහැ.. මම මෙහෙමම ඉන්නං.. මට තියෙනව උඹත් එක්ක කතා කරගන්න දෙයක්.. අපි යමු පොඩ්ඩක් එළියට.. නැන්දට කියල වරෙන්.."

අජිත් මොහොතක් කල්පනා කරමින් සිටියි. අවදානමක් පිළිබඳ කිසියම් හැඟීමක් ඔහුගෙ සිතේ දැල්වෙයි. එනමුදු කල්පනා කරමින් කාලය මරන්නට ඔහු නොසිතයි.

"යමු.." ඔහු සුනන්ද අනුව ගොස් වාහනයේ වම් පස අසුනේ වාඩි වෙයි. යතුර කරකවා ඇන්ජිම පණගන්වන සුනන්ද අජිත් දෙස හැරී බලයි. සුනන්ද ගේ මුහුණේ ඇඳී ඇති උපහාසාත්මක සිනාව අඩ අඳුරේ වුව හඳුනාගන්නට අජිත්ට හැකි ය.

"උඹ බය වුණා නේද මල්ලි.." සුනන්ද අසන්නේ අවඥාවෙනි "..උඹ දන්නව නේද..? වැරදි නොකරණ මිනිස්සු යකාටවත් බය නෑ.."

අජිත් පිළිතුරක් නොදෙයි. මහා මාර්ග යට අවතීර්ණ වන රථය රාත්‍රී අන්ධකාරය මැදින් ඉදිරියට යයි. යන්නේ කොතැනකදැයි අසන්නට අවශ්‍ය වුවත් එය අසන්නට ශක්තියක් නැත්තා සේ ය.

දාහතේ වත්ත පසු කර මඳ දුරක් වාහනය පදවන සුනන්ද අතුරු මාවතකින් හැරී ගොස් කුඩා නිවසක් ඉදිරියේ නවත්වයි. වාහනයේ සුක්කානම මත දෑත් තබාගත්වන ම අජිත් දෙස නොබලා ම සුනන්ද කතා කරයි.

"උඹ මෙතන දන්නෙ නෑ නේද..? මේ තමයි ඉස්සර මගේ මාළිගාව.. අපායත් මෙතනම තමයි තිබුණෙ.. හොඳින් හරි නරකින් හරි යමක් කරන්න ඕනෙ වුනාම ඒ කාලෙ අපි එකතු වුණෝ මෙතනට.. උඹ දන්නව මං මේ හැම දෙයකින්ම අත් මිදිලා අලුතින්ම ජීවිතේ පටන් ගන්න හදන බව.. ඒ නිසා ආයෙම වතාවක් මාව මේ ලෝකෙට ඇදල දාන්ඩ එපා මල්ලි.. දෙයියන්ගෙ නාමෙන් මං අහන දේට කෙළින් උත්තර දීපං.."

සුනන්ද අජිත් දෙසට හැරෙයි. ඔහුගෙ දෑස් ගිණියම්ව දැල්වෙමින් තිබෙනු අජිත්ට පෙනෙයි. අජිත් ගේ අරහිසින් දැඩිව අල්ලා ගන්නා සුනන්ද ඔහු තමා දෙසට හරවාගනියි.

"නැන්ද ඉස්සරහ අහන්න බැරි නිසයි මං උඹව මෙතෙන්ට එක්ක ආවෙ.. දැන් කියපං... උඹල අර කෙල්ලට මොකද කළේ..?"

"මො... මොන කෙල්ලටද..?"

"මොන කෙල්ලටද..? අයේෂට.. වෙන කාටද යකෝ අයේෂට.. . මාව යකෙක් කරන්නෙ නැතිව ඇත්ත කියපං.." සුනන්ද හිණාතුරින් ඇදගත් පිස්තෝලය අජිත් ගේ නළලට එල්ල කරයි. සුනන්ද කෝපයෙන් වියරුව සිටින්නේ යයි අජිත්ට සිතෙයි. මෙය සන්සුන් විය යුතු වේලාවකි.

"මේක ලොකු වැරදීමක් සුනන්දයියා.. මං මේ කිසි දෙයක් දන්නෑ.."

"එහෙනං මංද යකෝ දන්නෙ..? මං රණසිංහ කියන්නෙ කවුද කියල හොඳට අඳුනනවා.. උඹ කවුද කියලත් මං හොඳට දන්නවා.."

"සුනන්දයියා පිස්තෝලෙ පැත්තකට ගන්න.. අපි දෙන්න සහෝදරයො දෙන්නෙක් වගේ හිටිය දෙන්නෙක්.." අජිත් සන්සුන් ලෙස සුනන්දගේ අත පසෙකට කරයි. "...ඔයාට මං හැමදාම ගරු කළා.. අදත් එහෙමයි.. ඒක නැති කරගන්න හදන්න එපා.. ඔය පිස්තෝලෙ පැත්තකට කරගන්න.. මං ඕනෙ තරම් ආයුධ දැකලා තියෙනවා.. ඕනෙ තරම් ආයුධ අතගාලා තියෙනවා. ඕනෙ තරම් ඒවා පත්තු කරලා තියෙනවා.. ඒ නිසා මට ඕක දැක්කම කිසිම විශේෂ හැඟීමක් එන්නෙ නෑ.. මට ඔයාට කියන්න බැරි දෙයක් නෑ.. මං දන්නෙ නෑ අයේෂට මොකද වුණේ කියලා... ඒක රණසිංහ මහත්තයා දන්නවද කියලා කියන්නත් මං දන්නෙ නෑ.. අයේෂා උන්හිටි ගමන් වැඩට ආවෙ නෑ.. ඒ ඇරෙන්න වෙන කිසිම දෙයක් මං දන්නෙ නෑ.. යමක් දැනගත්තොත් මං ඒක ඔයාට එදාට කියන්නං.. තේරුණාද..? ඔයා වගේම මාත් මේ යන්තරේ ඇණ මුරිච්චියක් විතරයි.. යන්තරේ කරකවන්නෙ අපි නෙවෙයි.. අපි ආපහු යමු.. අම්ම බය වෙලා බලන් ඉන්නවා ඇති.."

මීළඟ කළාපයට

PDA Spice Island
All Sri Lankan-Indian & Asian Groceries Shop
සහල්
කුළු බඩු
වියළි ආහාර
ශීත කළ ආහාර
පුවත්පත්
ටෙලි නාට්‍ය
ඇතුළු ඔබට අවශ්‍ය සියලු ශ්‍රී ලාංකික බඩු භාණ්ඩ සඳහා අප අමතන්න
Sri Lankan
TAKE AWAY
Food
Now Open
at
Shop 3
Herbert Avenue
Hoppers Crossing
TP : 8742 2004 Mob : 0414 698 314